

# අප්පකිච්චෝච සල්ලහුකවුත්ති




තේරුණාත් නැතත් හොඳට හුරු පුරුදු වචන. මැති ඇමති අත්වල පමණක් නොව ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ අත් වලත් බැඳ ඇති තේඩා ලනු ප්‍රමාණයේ පිරිත් නූල වනාහි මේ වචන කීපය ලක්ෂ වාරයක් සවන් දී කම්මර වුණු අප්‍රාණික වස්තුවකි.

නූල බැඳ ගත් උදවියට ඉඳ හිට හෝ ඔය වචන වල අර්ථය ඔළුවට එනවා දැයි නොකිව හැකි ය.

එනවා නම් ගිය දෙසැම්බර් හත්වැනිදා වැනි දවසක ඉරිදා ලංකාදීපය පත්තරයට දයාසීලී ලියනගේ නම් ලේඛකයා මැති ඇමතිවරුන්ට ඇදුණු නත්තල් ස්වීප් එක ගැන දිග විග්‍රහයක් ලියන්නේ නැත. කර්තෘගේ වචන මට හරියට මතක නැත. අර්ථය ඔය කියාපු එකමය.

මැති ඇමතිවරුන්ට නිල වාහන ආදී පහසුකම් ගණනාවක් ලැබෙන බව දැන සිටියද මේ ලේඛකයා කියන විදියට දෙන දෙවියෝ ගෙදරට අවුත් දෙන මෙබඳු වරප්‍රසාද සම්භාරයක් ඇතැයි මා සිතුවේ නැත .

මම පරණ කතාවකින් පටන් ගන්නම්. නමසිය හැත්තෑ එකේ පමණ කතාවක්. කර්මාන්ත ඇමති ටී බී සුබසිංහ ඉදිරියේ වාඩි වී සිටින පිරිස අතර ඔහු හොඳින් හඳුනන පිටි සංස්ථාවේ සාමාන්‍යාධිකාරී නිමල් කරුණාරත්න ද ඇත. සාකච්ඡාව පොදු එකකි. එහිදී නිමල් අදහසක් ඉදිරිපත් කරන්නේ ඇමති තුමාට ය.

"සර් ඇමතිවරු වොක්ස්වාගන් වාගෙ පුංචි කාර් පාවිච්චි කළොත් අනිත් අයට හොඳ ආදර්ශයක් දෙන්න හැකි නේද?"

අහිංසක ප්‍රශ්නයක්. අවංක යෝජනාවක්.

සුබසිංහ ඇමතිතුමාගේ ප්‍රතිචාරය මට හොඳට මතකය. ඔහු වචනයක් කතා කළේ නැත. ඇස උඩ ඉන්දුවාගෙන නිමල් දිහා බලා සිටියා විතරය. මම එහි අර්ථය වටහා ගතිමි.

"අයිසේ තමුසේ කියන්නේ ඇමති කෙනෙකුට ඔය හුණ්ඩුවේ කූඩුවෙලා යන්න කියලාද?"

ඉන්දියාවේ ලොකුම නිලධාරීන් අදත් පාවිච්චි කරන්නේ ඒ රටේම නිෂ්පාදනය කරන ලද වාහන ය. ඔවුන්ට විදේශ යානාවක සුව පහසුව අවශ්‍ය නැත. අපේ මව් රටේ පුංචි නිලධාරියාට පවා නිල රථය මහන්තත්තකමේ සංකේතයක් බවට පත්ව ඇත. එය ඔහුගේ ගමන් බිමන් සඳහා පමණක් නොවේ. තත්වය ලොවට ප්‍රකාශ කිරීම ඊට වඩා වැදගත්ය.

එජාප රජය යටතේ අමාත්‍යංශ නිලධාරියෙක් සංස්ථාවක ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් ඉල්ලා ගත්තේ ය. එහි අරමුණ මට කිව්වේ ඒ නිලධාරියාම ය.

"මම ඒක ඉල්ලා ගත්තේ ඒකටත් නිල රථයක් දෙන හින්දා"

මේ මනුස්සයාට අමාත්‍යංශයෙන් දෙන නිල රිය ඇත. අනෙක් රථය නෝනාට සාප්පු යාමට ය. මේවා අද ඊයේ සිද්ද වෙච්ච විකාර විලාසිතා නොවේ. පාරම්පරිකව ශ්‍රී ලංකා දේශපාලකයන් හා නිලදරුවන් අත්පත් කරගෙන සිටින සුපිරි වරප්‍රසාද ය.

මා සේවය කළ අමාත්‍යංශයේ අධිපතියා සිය නිල රථයට අමතරව තවත් රියක් බිරියගේ ගමන් බිමන් සඳහා ගෙදරට යවා අප වැනි සෙසු නිලධාරීන්ගේ ගමන් සඳහා යොදවනු ලැබූ රියක්ද අල්ලාගෙන යාම නිසා අපේ රාජකාරි අතපසු වූ අවස්ථා මට මතකය. ආයතනයේ සේවය සඳහා මුදල් අය කළ නිසා ගමන නො-යාම ආයතනයට මුදලින් පාඩුවකි. ලොක්කාට ඒකේ වගක් නැත . ඔහු යන ගමන රාජකාරියට අවශ්‍යද නැත. එයත් කාගේවත් ප්‍රශ්නයක් නොවේ. අපි කතා නොකර ඉන්නෙමු.

අප එදා වැටී සිටි තත්වයේ නිලධාරීහු කී දෙනෙක් නම් අදත් අකම්පාලව බලා සිටිද්ද? ඔවුනුත් අසරණ ය.

දෙසැම්බර් මාසයේ කැන්බරා නුවර ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ නව ගොඩනැගිල්ල (නිල නිවාසය විය යුතු ය) විවෘත කරන උත්සවයක් කළ එක හොඳ ය. කොමසාරිස් කාර්යාලයේ සේවය ගැන කළකිරී සිටි උදවිය උත්සවය දැකලාවත් සතුටුවන්නට ඇත. පුදුමය එය නොවේ. කලින් හිටපු මහකොමසාරිස්ට හෝ ඔහුගේ ළමාතැනීට නිලනිවාස හොඳ මදි නිසා දහස් ගණනක කුලියකට නිවසක් ගත් බව කියන ලදී. එහෙම සල්ලි නාස්ති කරපු මහ කොමසාරිස් කාර්යාලයක අමාරුවෙන් ඉදිකරන ලද නව මන්දිරය විවෘත කිරීමට ශ්‍රී ලංකාවේ මහානායක හාමුදුරුනමක් ඇතුළු භික්ෂු පිරිසක් ගෙන්වාගෙන පිරිත් කියන්නට තීරණය කළේ උදාර නාස්තිකාර පුද්ගලයා නොවන බව නම් කිව යුතුය. සල්ලි විසි කරන්නට උතුරනම් කැමති විදියට වියදම් කිරීම වරදක් නොවේ. එසේ නම් ගමන් බිමන් හා වෙනත් දීමනා සඳහා වැය කරන්නේ කාගේ සල්ලි ද? තානාපති හෝ මැති ඇමති වරුන්ගේ සල්ලි නොවේ. මහජනතාවට අයත් මුදල් ය. අප ඉස්සර කියාපු විදියට සාංඝික දේපළ ය.

සාංඝික දේපළ අපට කැප නැතැයි කියූ බෞද්ධයන් සිටියේ ඉස්සර ය. දැන් සඟ සතු දේපළ තමන් සතු උරුමයක් ලෙස භුක්තිවිඳීම විලාසිතාවක්ව ඇත .

අපතර සිටින ශ්‍රී ලාංකික පුවත්පත් වේදියා වන ඇස් පියසේන මහතා මේ වැය ශීර්ෂය දෙස බලා කරන විග්‍රහයක් ඇත. ඔහු කියන හැටියට ඔවුන් මේ අප්පාගේ බාප්පාගේ බූදලය වාගේ අත දිගඇර වියදම් කරන්නේ ශ්‍රී ලංකාවේ අසරණ කාන්තාවන් මැද පෙරදිග ගොස් දහදුක් විඳිමින් අප රටට එවන විදේශ විනිමය ය. මම එහි ඇත්ත නැත්ත නොදනිමි. එහෙත් එස් පියසේන නිකරුණේ මෙහෙම දෙයක් කියන්නේ ද නැත .

ලංකාදීප ලේඛකයා හා පියසේන බඳු කීදෙනෙක් මේ නාස්තිය දැක අප්‍රසාදය පළ කරද්ද? ප්‍රශ්න කරද්ද? එයින් වැඩක් ඇද්ද?

ප්‍රශ්න දෙකක් ඉතිරිවන්නේ ය. එකක් සමස්ත ලෝක ප්‍රජාවටම බුදු දහමේ ආශිර්වාදය ලබා දීමට ඉදිරිපත්ව සිටින්නේ මේ කියන රජයේ බුද්ධශාසන ඇමතිවරයා නොවේ ද? රට පටවන්නට කලින් ඔය දහමේ හරය නිකමටවත් ළඟ රැඳී ඇද්දැයි බලන්නට තම තමන්ටම කියනවා නම් කොච්චර අගේ ද? අඩු ගණනේ ඔය අතේ පළඳවාගෙන ඉන්නා පිරිත් නූලට ගැබ් කොට ඇති මුලින් සඳහන් කළ වචන කීපයේ අර්ථය වටහා ගන්නට - වටහා දීමට තැත් කරන එක බුදු දහම රට පටවනවාට වඩා රටට හිතකර නොවේ ද?

දෙවැනි ප්‍රශ්නය මෙයයි. දේශපාලකයන් හා නායකයන් අහසින් කඩා වැටෙන්නේ නැත. මහජනතාව විසින් ඡන්දයෙන් ඉහළට ඔසවා තබනු ලැබිය යුතු ය. එහෙම නායකයන් සහ මැති ඇමතිවරුන් බිහිකිරීමේ සුපිරි බලය හා අධිකාරය හිමිකර ගෙන සිටින ශ්‍රී ලාංකික ජනතාවට - ඡන්දදායකයන්ට - මේ බහුබූත නොපෙනේ ද? ඔවුන් නුදුටුවා වාගේ ඇස් කන් පියාගෙන සිටින්නේ ඇයි?

ඇමතියන්ගේ චාටු බහට රැවටී අමු හෙළුවෙන් මහ මග යාමට පුරුදුව සිටි රජ්ජුරුවන්ගේ හෙළුවට ඇඟිල්ලක් එල්ල කොට "රජ්ජුරුවෝ හෙළුවෙන්" යයි කියන්නට පුංචි කොලු පැටියෙ-ක් සිටියේ ය. එහෙව් එකෙක් වත් පෙනෙන මානයක නැද්ද?


## αlpha academy

Primary, Secondary ,VCE

**2013 Program - Enrollments open**

Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts, Analytical Writing

Classes conducted by Current School Teachers

**Contact - Sarah on 0457908918**
ABN 52267352093